# අනුප්‍රාප්තික ජනාධිපතිවරයා

## අන්තර්ගතය පිටුව


1. හැදින්වීම ........................................................................................... 2

2. ජනාධිපති ධූරය පුරප්පාඩු වීම........................................................................ 2

3. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම............................. 3

4. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ කාර්ය පටිපාටිය 4

අ. පාර්ලිමේන්තුවෙන් ජනාධිපතිවරයා තේරීමට අදාළ කරුණු.......................... 4

ආ. පාර්ලිමේන්තුව කැඳවීම........................................................................ 4

ඇ. නියමිත කාල රාමුව.............................................................................. 5

ඉ. නාමයෝජනා ලබා ගැනීම...................................................................... 5

ඊ. ඡන්ද විමසීම පැවැත්වීමේ ක්‍රමවේදය........................................................ 5

I. පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්යභාරය...................................... 6

II. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කාර්යභාරය............................................ 7

III. ඡන්දය ලබා දෙන ආකාරය.................................................................. 8

IV. ඡන්ද පත්‍රිකාවේ ආදර්ශ ආකෘතිය ........................................................ 8

V. ඡන්ද පත්‍රිකාවක් අවලංගු වන අවස්ථා.................................................... 8

5. ජනාධිපති ධූරය පුරප්පාඩුවීම සහ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම අතර කාල සීමාව........................................................................................... 9

## 1. හැඳින්වීම

මෙම සටහනේ 'අනුප්‍රාප්තික ජනාධිපතිවරයා' යන්නෙන් අදහස් කරන්නේ ධුරයේ සිටින ජනාධිපතිවරයාගේ වසර පහක නිල කාලය සම්පූර්ණ වීමට පෙර එම ධුරය පුරප්පාඩු වීම නිසා පාර්ලිමේන්තුව විසින් තෝරා පත් කර ගන්නා නව ජනාධිපතිවරයායි. එවැනි අවස්ථාවකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ඇති නෛතික ප්‍රතිපාදන පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරේ. මීට අමතරව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව මෙවැනි අවස්ථාවකදී ක්‍රියාත්මක කරනු ලබන පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටිය පිළිබඳව ද මෙහිදී විමර්ශනය කෙරේ.

## 2. ජනාධිපති ධුරය පුරප්පාඩු වීම

ජනාධිපතිවරයෙකු ජනාධිපතිවරණයකින්[1] තේරී පත් වූ පසු (ජනතාව විසින් මැතිවරණයකින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගන්නා ක්‍රියාවලිය මෙයයි), එම පුද්ගලයා වසර පහක කාලයක් ධුරය දරන අතර[2] , එම කාලය අවසන් වීමත් සමඟ ධුරය අවසන් වනු ඇත. ජනතාව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා එලෙස ජනාධිපතිවරණයක් පැවැත්විය හැක්කේ වසර පහක ධුර කාලය අවසන් වූ පසුව වන අතර[3] එයට පෙර පැවැත්විය නොහැක[4]. එවිට ගැටලුව වන්නේ ධුරයේ සිටින ජනාධිපතිවරයකු වසර පහක ධුර කාලය අවසන් වීමට පෙර, එනම් මහජන ඡන්දයක් පැවැත්වීමට නොහැකි අවස්ථාවක එම ධුරය පුරප්පාඩු වුවහොත් කුමක් සිදුවේද යන්නයි. එවැනි ප්‍රශ්නයක් ගැන විමසා බැලීමට පෙර, ධුරයේ සිටින ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන් වීමට පෙර එම ධුරය පුරප්පාඩු වන්නේ කෙසේද යන්න විමසා බැලීම යෝග්‍ය වේ. එවැනි අවස්ථාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වැනි වගන්තිය මගින් දක්වා ඇත:

1. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම නිෂ්ප්‍රභ බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇති අවස්ථාවක[5]
2. ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා එසේ තෝරාපත් කර ගනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමට අපොහොසත්වූ අවස්ථාවක[6],
3. ජනාධිපතිවරයා මිය ගිය අවස්ථාවක[7],

[1] ආ.ව්‍යවස්ථාව 31 ව්‍යවස්ථාව
[2] ආ.ව්‍යවස්ථාව 30(2)
[3] ආ.ව්‍යවස්ථාව 31(3)
[4] ආ.ව්‍යවස්ථාව 31(3අ) සඳහන් අවස්ථාව හැර
[5] ආ.ව්‍යවස්ථාව 38(1)
[6] ආ.ව්‍යවස්ථාව 38(1)
[7] ආ.ව්‍යවස්ථාව 38(1)

4. ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුව සිටීම නතර වූ අවස්ථාවක[8],
5. ජනාධිපතිවරයා ධුරයෙන් අස්වූ අවස්ථාවක[9],
6. පාර්ලිමේන්තුව මගින් සම්මත කල දෝෂාභියෝගයක් හරහා ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කළ අවස්ථාවක[10],

ඉහත සඳහන් කර ඇති ඕනෑම අවස්ථාවකදී, වසර පහක නිල කාලය සම්පූර්ණ වීමට පෙර ජනාධිපති ධුරය පුරප්පාඩු විය හැකිය. එවිට, ජනතාවගේ ඡන්ද විමසීමක් නොමැතිව, අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු පත් කර ගත හැක්කේ කෙසේද?

## 3. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා ගැනීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 (1) (අ) ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි වසර පහක ධුර කාලය අවසන් වීමට පෙර ජනාධිපති ධුරය පුරප්පාඩු වුවහොත්, "පාර්ලිමේන්තුව විසින් ජනාධිපති ධුරයට තේරී පත් වීමට සුදුසුකම් ඇති මන්ත්‍රීවරයෙකු ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතුය"[11]. මෙම සටහනේ අරමුණ සඳහා, එම තෝරා පත්කර ගැනීම 'පාර්ලිමේන්තුවෙන් ජනාධිපතිවරයා තෝරා ගැනීම' ලෙස හඳුන්වනු ලබන අතර, එසේ තේරී පත්වන පුද්ගලයා 'අනුප්‍රාප්තික ජනාධිපතිවරයා' ලෙස හඳුන්වා ඇත. අනුප්‍රාප්තික ජනාධිපතිවරයා' ඔහුගේ පූර්වගාමී ජනාධිපතිවරයාගේ ඉතිරි ධුර කාලය සඳහා ජනාධිපති ධුරය දරනු ඇත.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපතිවරණය නිෂ්ප්‍රභ කළ හොත් 'පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා' යන ක්‍රියා පටිපාටිය ඊට අදාළ නොවේ[12]. එවැනි ව්‍යතිරේකයක් සඳහා පැහැදිලි හේතුවක් නීතියෙන් සපයා නොමැති අතර[13] ජනාධිපතිවරයෙකුට තම ධුර කාලය අවසන් වීමට පෙර සිය ධුරයෙන් ඉවත් විය හැකි අවස්ථා හයෙන් (ඉහත 38 වැනි වගන්තිය) පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා අදාළ වන්නේ අවස්ථා පහක් පමණක් බව පැහැදිලිය.

[8] ආ.ව්‍යවස්ථාව 38(1)
[9] ආ.ව්‍යවස්ථාව 38(1)
[10] ආ.ව්‍යවස්ථාව 38(1)
[11] 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ විශේෂ විධිවිධාන පනත, 3 වන වගන්තිය
[12] එම
[13] එවැනි අවස්ථාවක 31(ඇ) ව්‍යවස්ථාවේ විධිවිධාන බොහෝ දුරට අදාළ කර ගැනීමට අවස්ථාව ඇත.

# 4. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය

## a. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමට අදාළ කරුණු

පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සම්බන්ධ සියලු කටයුතු සඳහා විධිවිධාන සැලසීමට ව්‍යවස්ථාදායකයට ඇති බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පිළිගෙන ඇත.[14]ස්ථාවර නියෝග අංක 7[15] මගින් 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මෙම අවස්ථාවට අදාළ කරගත යුතු බව පැහැදිළිව දක්වා තිබේ. අදාළ ඡන්ද විමසීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාදාමයන් විස්තර කිරීමට අමතරව, ඡන්ද ප්‍රතිඵලවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් ඉදිරිපත් කිරීම[16], අයුතු බලපෑම් සහ අල්ලස් ගැනීම් යන අයෝග්‍යතා[17] සහ පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇතිවිට ජනාධිපතිධූරය පුරප්පාඩුවන අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද එම පනත මඟින් නෛතික ප්‍රතිපාදන සපයා ඇත[18].

## b. පාර්ලිමේන්තුව කැඳවීම

පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ක්‍රියාදාමය ආරම්භ කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවය වන්නේ පාර්ලිමේන්තුව කැඳවීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වැනි ව්‍යවස්ථාව අනුව, පාර්ලිමේන්තුව කැඳවීමේ බලය ජනාධිපතිවරයා සතු වේ. එසේ නම් ජනාධිපති ධූරය හිස් වූ අවස්ථාවක පාර්ලිමේන්තුව කැඳවන්නේ කෙසේදැයි ප්‍රශ්නයක් පැන නගී. 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් මේ සඳහා පිළිතුරු සපයා ඇත. එහි දක්වා ඇති පරිදි "පාර්ලිමේන්තුව විසුරුවා හැර නොමැති අවස්ථාවක ජනාධිපති ධූරය පුරප්පාඩු වීම එම පුරප්පාඩුව ඇතිවූ දින සිට දින තුනක් ඇතුළත පාර්ලිමේන්තුව කැඳවීමක් ලෙස ක්‍රියාත්මක විය යුතුය"[19].

---

[14] ආ.ව්‍යවස්ථාව 40(1), ආ.ව්‍යවස්ථාව 40(3)
[15] ස්ථාවර නියෝග අංක 7
[16] 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ විශේෂ විධිවිධාන පනත, 19,22,23,24 සහ 25 වගන්ති

[17] එම පනතේ 20 වැනි වගන්තිය
[18] එම පනතේ 14-16 වගන්ති
[19] එම පනතේ 3,4 වගන්ති

## c. නියමිත කාල රාමුව

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කළ යුතු වීමේ අවශ්‍යතාව පිළිබිඹු කරමින් එම ක්‍රියාවලියට අදාළ නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පැහැදිලිව දක්වා ඇත. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීමේ අවශ්‍යතාවය පැනනගින විට, ධුරයේ සිටින ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් වූ දින සිට මාසයකට නොඅඩු කාලයක් ඇතුළත එවැනි ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කර ඇත.[20] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දක්වා ඇති පරිදි අනුප්‍රාප්තික ජනාධිපතිවරයා "හැකිතාක් ඉක්මනින්" තෝරා පත් කරගත යුතුය[21].

## d. නාමයෝජනා භාර ගැනීම

- පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා අමතමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ජනාධිපති ධුරය සඳහා පැමිණ සිටින වෙනත් මන්ත්‍රීවරයෙකු යෝජනා කළ යුතුය.[22]
- එම යෝජනාව වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් ස්ථිර කළ යුතුය.[23]
- එක් මන්ත්‍රීවරයෙකු පමණක් ජනාධිපති ධුරය සඳහා යෝජනා කර ස්ථිර කොට ඇත්නම් නාමයෝජනා භාර ගන්නා දිනයේම, ඔහු ජනාධිපති ධුරයට තේරී පත් වූ බවට මහලේකම්වරයා විසින් ප්‍රකාශ කළ යුතුය.[24]
- එක් මන්ත්‍රීවරයෙකුට වැඩි සංඛ්‍යාවක් ජනාධිපති ධුරය සඳහා එසේ යෝජනා කර ස්ථිර කරනු ලැබුව හොත්, පාර්ලිමේන්තුව විසින් අදාළ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා දිනයක් සහ වේලාවක් නියම කළ යුතුය.[25]

## e. ඡන්ද විමසීම පැවැත්වීම

- අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා ගැනීම පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි යම් කාර්ය පටිපාටියකට අනුකූලව රහස් ඡන්දයෙන් සහ ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් ඒකාන්ත බහුතර ඡන්ද සංඛ්‍යාවෙන් සිදුකළ යුතුය.[26] ඒකාන්ත බහුතරය යනු වලංගු ඡන්ද වලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයකි.

- කිසිදු අපේක්ෂකයෙකුට ඒකාන්ත බහුතරයක් ලැබී නොමැති නම් හෝ අපේක්ෂකයන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ඇත්නම් 1981 අංක 2 දරන

[20] ආ.ව්‍යවස්ථාව 40(1),
[21] එම
[22] 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ විශේෂ විධිවිධාන පනත, 6(3)වගන්තිය
[23] එම
[24] 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ විශේෂ විධිවිධාන පනත, 6(4)වගන්තිය
[25] එම
[26] ආ.ව්‍යවස්ථාව 40(1),

ජනාධිපති මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 12 සහ 13 වගන්තිවල දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව ක්‍රියා කළ යුතු වේ.

## I. පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්යභාරය

1. පාර්ලිමේන්තුව කැඳවීම පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම[27].

2. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා අපේක්ෂකයින්ගේ නාමයෝජනා භාර ගැනීමට[28] දිනයක් සහ වේලාවක් නියම කිරීම[29]

3. පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තේරීම සඳහා ඡන්ද විමසීම පැවැත්වෙන දිනයේදී තේරීම් භාර නිලධාරියා ලෙස කටයුතු කිරීම.[30]

   අ. මන්ත්‍රීවරයන්ට හිස් ඡන්ද පෙට්ටිය/පෙට්ටි පෙන්වීම සහ ඉන්පසු එය මුද්‍රා තැබීම.[31]

   ආ. ඡන්දය ප්‍රකාශ කිරීම ආරම්භ කළ පසු ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීම සඳහා කථානායක ඇතුළු එක් එක් මන්ත්‍රීවරයාගේ නම අඬ ගැසීම.[32]

   ඇ. තේරීම් භාර නිලධාරියා විසින් මන්ත්‍රීවරයා ඉදිරියේ ඡන්ද පත්‍රිකාවේ පිටුපස සිය මුලකුරු සහිත කෙටි අත්සන යෙදීම.

   ඈ. නම අඬ ගැසූ විට ඡන්දය නොදුන් යම් මන්ත්‍රීවරයෙකුගේ නම ඡන්දය දීම අවසන් කළ යුතු වෙලාවට පෙර දෙවන වරටත් අඬ ගසන අතර, එහිදී ද එම මන්ත්‍රීවරයා ඡන්දය නොදෙන්නේ නම් ඔහු ඡන්දය දීමෙන් වැළකී සිටිය ලෙස සලකනු ලැබේ.[33]

---

[27] 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ විශේෂ විධිවිධාන පනත, 4 වන වගන්තිය
[28] 1981 අංක 2 දරන පනතේ 5 වන වගන්තිය
[29] එම දිනය සහ වෙලාව පැය 48 කට නොඅඩු සහ දින 7කට නොවැඩි විය යුතුය
[30] එම 7(1)1
[31] එම 7(2)
[32] එම 7(3)
[33] එම 7(8)

ඉ. එසේම මන්ත්‍රීවරයෙකු විසින් අනවධානයෙන් ඡන්ද පත්‍රිකාවක් නරක් කරන ලද්දේ නම් එම මන්ත්‍රීවරයාට වෙනත් ඡන්ද පත්‍රිකාවක් ලබා දිය යුතුය. [34]

ඊ. සලකුණු කළ ඡන්ද පත්‍රිකා අනුව ඡන්ද ගණන් කිරීම.[35]

උ. ඒකාන්ත බහුතරයක් ලබාගෙන ඇති අපේක්ෂකයා ප්‍රකාශයට පත් කිරීම. [36]

එ. ජනාධිපති ධුරයට තෝරා පත් කරගත් බවට ප්‍රකාශ කර ඇති අපේක්ෂකයාගේ නම තෝරා පත් කරගැනීමේ දින සිට දින තුනක් ඇතුළත (ඡන්ද විමසීමෙන් දින තුනක් ඇතුළත) ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.[37]

ඒ. මන්ත්‍රීවරයෙකු ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ පසු එම ඡන්ද පත්‍රිකා පෙට්ටියක තබා මාස හයක් තමන් භාරයේ තබා, පාර්ලිමේන්තුවෙන් ලැබිය හැකි යම් විධානයකට යටත්ව එම ඡන්ද පත්‍රිකා විනාශ කිරීමට සලස්වා ඒබව පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතුය.[38]

## II. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කාර්යභාරය

1. තේරීම් භාර නිලධාරියාගෙන් ඡන්ද පත්‍රිකාව ලැබුණු පසු, සභා ගර්භයේ දී ඇති කුටිය වෙත ගොස් ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම.[39]
2. සලකුණු කළ පසු, ඡන්ද පත්‍රිකාව නමා, ආපසු තේරීම් භාර නිලධාරියා වෙත ගොස් ඔහුගේ මේසය මත තබා ඇති ඡන්ද පෙට්ටියට දැමීම. [40]

[34] එම 7(7)
[35] 1981 අංක 2 දරන පනතේ 10, 12 සහ 13 වගන්ති
[36] එම 11 වන වගන්තිය
[37] එම 17 වන වගන්තිය
[38] එම 18 වන වගන්තිය
[39] එම 7(4) වන වගන්තිය
[40] එම 7(6) 8 වන වගන්තියත් බලන්න

## III. ඡන්දය ප්‍රකාශ කරන ආකාරය.

1. මන්ත්‍රීවරයා ඡන්දය දෙන අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් ඇති කොටුවෙහි "1" යන ඉලක්කම යෙදීම මගින් ඡන්දය සළකුණු කිරීම සිදුකළ යුතුය.[41]

2. මන්ත්‍රීවරයාගේ 1 වැනි මනාපයට අමතරව අපේක්ෂකයන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සිටින්නේ නම් , තමන්ගේ මනාපයේ අනුපිළිවෙල අනුව අපේක්ෂකයන්ගේ නම් ඉදිරියෙන් ඇති කොටුවල 2,3,4 ආදී වශයෙන් ඉලක්කම් යෙදිය යුතුය.

## IV. ඡන්ද පත්‍රිකාවේ ආදර්ශ ආකෘතිය

| අපේක්ෂකයාගේ නම | මනාපයේ අනුපිළිවෙළ |
|---|---|
| අ. (අපේක්ෂකයාගේ නම) | |
| ආ. (අපේක්ෂකයාගේ නම) | |
| ඇ. (අපේක්ෂකයාගේ නම) | |
| ඈ. (අපේක්ෂකයාගේ නම) | |

## V. ඡන්ද පත්‍රිකාවක් අවලංගු අවස්ථා [42]

(අ) මන්ත්‍රීවරයා හඳුනාගත හැකි යම්කිසි දෙයක් ලියා ඇති හෝ සලකුණු කර ඇති; හෝ

(ආ) තේරීම් භාර නිලධාරියාගේ කෙටි අත්සන නොමැති; හෝ

(ඇ) '1' යන ඉලක්කම සලකුණු කර නොමැති; හෝ

(අ) අපේක්ෂකයින් එක් අයෙකුට වඩා වැඩි ගණනකගේ නමට ඉදිරියෙන් 1 ඉලක්කම සලකුණු කර ඇති; හෝ

(ඉ) සලකුණු නොකරන ලද හෝ අවිනිශ්චිතතාවය නිසා බල රහිත වන්නා වූ; හෝ

ඡන්ද පත්‍රිකාවක් අවලංගු වේ.

---

[41] 1981 අංක 2 දරන පනතේ 8 වන වගන්තිය

[42] එම 9 වන වගන්තිය

## VI. ජනාධිපතිධුරය පුරප්පපාඩු වීම සහ 'පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීම අතර කාලසීමාව

ඉහත සඳහන් කළ පරිදි, නියමිත කාල සීමාවන් තිබියදීත්, 'පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා' පත්කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සහ සම්පූර්ණ කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත. එබැවින් මෙම කාර්ය පටිපාටිය අවසන් වන තෙක් වැඩබලන ජනාධිපතිවරයෙකුගේ කාර්ය භාරය ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා ඇත. මෙම විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1) සහ 40(2) වගන්ති වල අඩංගු වේ.

එබැවින් එවැනි අතුරු කාලසීමාවක් සඳහා අග්‍රාමාත්‍යවරයා ‘වැඩබලන ජනාධිපති' බවට පත්වන අතර ඔහු විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වැඩබලන අග්‍රාමාත්‍ය ධූරයට පත් කරනු ඇත. අග්‍රාමාත්‍යවරයාට වැඩබලන ජනාධිපති ධූරය භාර ගැනීමට නොහැකි වුව හොත් කථානායකවරයා එම ධූරයට පත්වනු ඇත.[43]

[43] 43 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(4)(ආ) සහ 31(4) (ඇ) ව්‍යවස්ථාවලද මේ සම්බන්ධව විධිවිධාන ඉදිරිපත් කර ඇත.